# අභයගිරි විහාරයේ ධර්මරුචි නිකාය හා ඒ පිළිබඳ අලුතින් සොයාගත් අභිලේඛනයක්

ඩබ්. පී. පී. ගම්ලත්

ලක්දිව මහාවිහාරය පිහිටුවීමෙන් වර්ෂ දෙසිය දහතුනක් හා දින දහයක් ඉකුත් වූ පසු වළගම්බා රජු විසින් (ක්‍රි. පූ. 89 - ක්‍රි. පූ. 77) අභයගිරි නම් විහාරය තනවා තම හිතැති මහා තිස්ස භික්ෂුවට පුදන ලදී.[1] එහෙත් ආ සාම්ප්‍රදායික ක්‍රමයෙන් බැහැරව කරන ලද මෙම පූජාව දුටු සේ පිළිකෙව් කළ මහාවිහාරීය භික්ෂූහු එම පූජාව පිළිගත් මහා තිස්ස තෙරුන්ට පබ්බාජනීය නම් විනය කර්මයෙන් දඬුවම් පැමිණවූහ.[2] ස්වකීය ආචාර්ය වරයාට කරන ලද මෙම දඬුවමට දැඩිසේ එරෙහි වූ තද්ශිෂ්‍ය බහලමස්සුතිස්ස නම් තෙරණුවෝ පන්සියයක් භික්ෂූන් ගෙන මහා විහාරයෙන් භින්නව අභයගිරි නම් අභිනව විහාරයෙහි නේවාසික වූහ. මහාවිහාරය හා අභයගිරිය අතර තරඟය ආරම්භ වන්නේ ඉන් අනතුරුවය.

බුද්ධ කාලයේ පවා භික්ෂූන් අතර විවිධ අර්බුද පහළ වූ බව විනය පිටකයෙන් පැහැදිලි වෙයි. කොසඹෑ නුවර භික්ෂූන් ඡබ්බග්ගිය භික්ෂූන්, තෙරසවග්ගිය භික්ෂූන් හා ඡන්න තෙරුන් ද නිදසුන් ලෙස දක්විය හැකිය. බුද්ධ පරිනිර්වාණයෙන් වසර සියයක් ඉකුත් පසු මෙම භේද අසාමාන්‍ය ලෙස වර්ධනය වූ බව දෙවන සංගායනාවක් පැවැත්වීමේ අවශ්‍යතාව පැන නැඟීමෙන්ම ප්‍රකට වෙයි. වෛශාලිවාසීන් ගේ දස අකැප වස්තුව ඊට මූලික හේතුව විය.[3] ඒවා විනය සේ දැඩිව ගත් භික්ෂූන් මහාසංඝික නමින් හැඳින් වූ අතර, ආචාර්යවාද නමින් වාදයක් ද ඔවුන් අතර ව්‍යාප්ත විය. වජ්ජිපුත්තක නමින් ප්‍රකට වූයේ ද එහි ම කොටසකි. එම වජ්ජිපුත්තක භික්ෂූන්ගෙන් පල්ලරාරාමයේ විසූ ධර්මරුචි නම් භික්ෂුවගේ ශිෂ්‍ය පිරිසක් වළගම්බා අවදියේ ම ලක්දිවට පැමිණ, අභයගිරියේ ලැගුම් ගත්හ.[4] ඔවුන් විසින් ආරම්භ කරන ලද නිකාය ධර්මරුචි නම් විය.